ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව
உள்நாட்டு தொழிற்பாடுகள் திணைக்களம்
Domestic Operations Department

2020 ජුනි 29

<u>මෙහෙයුම් උපදෙස් අංක : 35/03/016/07/006</u>

**සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,**

**විවට වෙළඳ කටයුතු යටතේ නිත්‍ය පහසුකම සඳහා පවතින පද්ධතිය තුළ හඳුන්වා දෙන ලද නවීකරණ**

2016 ඔක්තෝබර් 26 දින නිකුත් කරන ලද විවට වෙළඳ කටයුතු යටතේ ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස්වල අංක 35/03/016/001/001 දරන චක්‍රලේඛය සහ ඉන්පසුව කරන ලද සංශෝධන හා සම්බන්ධවයි.

2020 ජුලි 06 වන දින සිට බලපැවැත්වෙන පරිදි විවට වෙළඳ කටයුතු යටතේ ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස්වල අඩංගු නිත්‍ය පහසුකම සඳහා වන වගන්ති පහත පරිදි සංශෝධනය වේ.

**30 වන වගන්තිය :**
සහභාගිත්ව ආයතනවලට ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුදල් තැන්පත් කිරීම සඳහා නිත්‍ය තැන්පතු පහසුකම ද අදාළ සුරැකුම්පත් ඉදිරිපත් කිරීමෙන් පසු අරමුදල් ණයට ගැනීම සඳහා නිත්‍ය ණය පහසුකම ද දෛනික පහසුකම් ලෙස භාවිතා කළ හැකිය. නිත්‍ය පහසුකම යටතේ තැන්පත් කරන හෝ ණයට ගන්නා අරමුදල් ප්‍රමාණය එකී ආයතනවල අභිමතය මත සිදු වේ. විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය හරහා නිත්‍ය තැන්පතු පහසුකම/නිත්‍ය ණය පහසුකම යටතේ තැන්පතු/ඉල්ලුම් කරන ප්‍රමාණය පිළිබඳ පූර්ණ වගකීම සහභාගිත්ව ආයතනය සතු වේ. ඒ අනුව, අදාළ තැන්පතු/ඉල්ලුම් කළ ප්‍රමාණය පද්ධතිය හරහා නියමිත වේලාවට ස්වයංක්‍රීයව අනුමත වනු ඇත.

**31 වන වගන්තිය :**
නිත්‍ය තැන්පතු පහසුකම ලබාගැනීමට බලාපොරොත්තු වන සහභාගිත්ව ආයතන එම ගනුදෙනුව විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතියට 15:30 පැය වන විට ඇතුළත් කළ යුතුය.

**41 වන වගන්තිය :**
නිත්‍ය ණය පහසුකම ලබාගැනීමට බලාපොරොත්තු වන සහභාගිත්ව ආයතන එම ගනුදෙනුව විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතියට 15:30 පැය වන විට ඇතුළත් කළ යුතුය.

විවට වෙළඳ කටයුතු යටතේ ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස්හි අඩංගු වන නිත්‍ය පහසුකම සඳහා අදාළ වන කලින් කලට සිදු කරන ලද සංශෝධන සහිතව අනෙකුත් සියලුම වගන්ති නොවෙනස්ව පවතිනු ඇත.

අධ්‍යක්ෂ/දේශීය මෙහෙයුම් කටයුතු

7 වන මහල, 2 වන කුළුණ
අංක 30, ජනාධිපති මාවත
තැ.පෙ. 590, කොළඹ 01, ශ්‍රී ලංකාව

தளம் 7, கோபுரம் 2
இல. 30, சனாதிபதி மாவத்தை
த.பெ 590, கொழும்பு 01, இலங்கை

Level 7, Tower 2
No. 30, Janadhipathi Mawata
P.O. Box 590, Colombo 01, Sri Lanka

+94 112 477036 +94 112 346287 ddod@cbsl.lk www.cbsl.gov.lk